

# නුවණක්කාර දඬුවම

වයි.එම්.සෙතුණි යුවන්නියා දසනායක
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

## <u>පිදුම</u>

**සාහිත්‍ය නිර්මාණකරණයේ**

**රස තැන් ස්පර්ශ කරමින් ලේඛණ කලාවට කුඩා කල**

**සිටම අත්පොත් තබන්නට ඉඩ හසර ලබාදුන්**

**ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක**

**සෙනවිරත්න අඳුරුතුමණ්ට,**

**නිබඳව මාව උනන්දු කරමින් දිරිය දුන් මහාමායා**

**මවුන්ගේ ගරු විදුහල්පතිතුමිය,**

**ශෂිකලා සේනාධීර ගුරු මවුන්ටත්,**

**නිබඳව මට සෙවනක් වූ**

**පන්ති භාර ගුරු මෑණියන්ටත් ,**

**මෙම පොත් පිංච**

**ගෞරවයෙන් පුදදෙමි.**

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ ,දඹදෙණිය යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථීකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුල පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථීකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි.ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛණ කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර

කැලෑවක නපුරු, කපටි නරියෙක් සිටියා. එයා කුරුලු කූඩුවල පැටව් බිත්තර කා දැමුවා.කැලේ සතුන් හරිම බයෙන් ජීවත් වුණේ. නරියා බිත්තර වලට පැටවුන්ට හරි ආසයි.එක කටට ගිල දමනවා...



කුරුල්ලන්ට හරි ප්‍රශ්ණයක් එයාලා බය වෙලා, පුදුමයට පත්වෙලා. කූඩුවල බිත්තර දවසින් දවස අඩුවෙනවා. හාවන්, මුවන් හා කැලේ සිටින ගොඩාක් සත්තු බය වෙලා. ගුල්වල පැටවුන් අඩුවෙලා හැමෝම එකතු වෙලා හැංගිලා බලාගෙන ඉමු. කුරුල්ලන් අතු අතර හැංගුණා. අනෙක් සතුන් පඳුරු අස්සේ හැංගුණා.

නරියා වෙනදා වගේ පැටවුන් අල්ලා ගන්නට හෙමින් හෙමින් ගුල ළඟට ළං වුණා.



හා "ඔය එන්නේ නුඹ තමයි බිත්තර,පැටවුන් කෑවේ. හොඳ වැඩක් කරන්නම්".ගුල ළඟට නරියා එන විටදී කුරුල්ලන් කොටන්න පටන් ගත්තා. නරියා හූ කියමින්, කෑගසමින් බියවී දුවන්න ගත්තා.



ආයෙත් නරියා එයිද? දන්නේ නෑ..... අපි මොකද කරන්නේ. සියලුදෙනා එකතු වෙලා සාකච්ඡා කළා.අපි ගසේ මුදුනේ කූඩු හදමු.





අපි මේ කැලය අත හැරලා වෙන කැලයකට යමු. සමහර සතුන් කීවා. එතන හිටිය සතුන් කැලය අත හැරලා වෙන තැනකට යාමට කැමති වුණේ නෑ. එහෙමනම් අපි මොකද කරන්නේ එතන හිටිය එක නුවණක්කාර හාවෙක් අපූරු උපායක් කීවා.

අපි නරියාට හොඳ පාඩමක් උගන්වමු. නරියා යන පාරේ වළක් හාරලා, අතු කොළ උඩින් දාමු අතු උඩින් කූඩුවක් තියලා බිත්තර තියමු. හා.. හා.. එහෙම කරමු. හැමෝම කූඩුව තියලා හැංගිලා බලාගෙන හිටියා.



නරියා පුරුදු දඩයමට පාර දිගේ හෙමින් හෙමින් ආවා.වල උඩ තිබෙන බිත්තර දැක කැමට අතු උඩ පැන්න ගමන් වලට වැටුණා.



අනෙක් සතුන්ට හරි සතුටුයි . හැමෝම වල ළඟට ආවා. හොඳ වැඬේ අපේ පැටව්, බිත්තර කෑවට. “මාව බේරගන්න. ආය කරදර කරන්නේ නෑ.” නරියා අඬන්න වුණා.

බෑ... බෑ.....බෑ .... බේරගන්ටද කියන්නේ ? නරි රාළේ කීයටවත් ඒක කරන්න බෑ නුඹ අපිට ගොඩක් කරදර කළා. අපේ ළමයි පැටවු අපට නැති කළා. හොඳ වැඬේ. අපිට කරදර කළාට.

අනේ එහෙම කරන්න එපා.ආය කවදාවත් මම ඔයාලට හිරිහැර කරන්නේ නෑ. කිසිම කෙනෙකුට කරදර කරන්නේ නෑ.මාව උඩට ගන්න අනේ මගේ දරුවෝ මා එනතෙක් බලාගෙන ඇති.අනේ මාව ගොඩට ගන්න . ඔයාලාට පිං ..

හා දැන්ද දරුවෝ මතක් වුනේ? අපේ දරුවෝ අපිට නැතිකරන විට දුක හිතුණේ නැද්ද? හොඳ වැඩේ.ඔය වළේදීම ඔහෙත් මැරිලා යාවි නරියෝ ....

අනේ මාව ගොඩට ගන්න.. ..................... අනේ මාව ගොඩට ගන්න.. ..................... අනේ මාව ගොඩට ගන්න..

මං කල වැරදි වලට මට සමාව දෙන්න... මං ඔයාලට පොරොන්දු වෙනවා ආය කරදර නොකරන්න. ඔයාලාව ආරක්ෂා කරන්න. මාව ගොඩට ගන්න.



අනේ මාව ගොඩට ගන්න. අපි මෙයාට සමාව දෙමු. කරපු වැරැද්ද පිළිගෙන ආය වැරදි නොකරන්න පොරොන්දු වෙනවනේ .... හාවෙක් කියන්ට උනා..

කොහොමද? අපි මෙයාව විශ්වාස කරන්නේ ? සත්තු එකිනෙකා දිහා බලාගෙන කියන්න පටන් ගත්තා. නෑ නෑ... මාව විශ්වාස කරලා ගොඩට ගන්න .

මම ඔයාලාට පොරොන්දු වෙනවා මේ කැලය ඇතහැරලා වෙන කැලයකට යන්න. අනේ මාව ගොඩට ගන්න. හරි... හරි... නරි රාළේ නුඹව ගොඩටගන්නම් , හැබැයි ඔය නරක වැඩ ආය කරන්න එපා.

මේ කැලය අත හැරලා යන්න ඕනේ නැහැ. අපි ඔක්කොම යාළුවෝ වගේ හිදිමු. හා .. හා ... මම පොරොන්දු වෙනවා. කොහොමද අපි නරිරාළව ගොඩට ගන්නේ හා හාමී ඒක තමා මාත් කල්පනා කළේ ... හරි අපි කැලේ තියෙන අතු ගෙනල්ලා වලට

දාමු. එතකොට අතු දිගේ නරි රාළට ගොඩට එන්න පුලුවන්.



හොඳයි හා හාමි අපි හැමෝම යමු. යාළුවෝ කැලයට ගොස් අතු ගෙනත් වලට දැම්මා. ඒත් නරි රාළට අතු දිගේ උඩට එන්න බැරි උනා.. අපි දැන් මොකද කරන්නේ ... හරි ඉත්තෑරාළේ අපි එකතු වෙලා නරි රාළ ඉන්න වලට උමඟක් හාරමු.



එතකොට නරිරාළට උමඟ දිගේ ගොඩට එන්න පුළුවන්. හා යාළුවොයි ඉත්තෑ යාළුවොයි ඉක්මනින් උමඟ හෑරුවා. නරිරාළ උමඟ දිගේ අමාරුවෙන් ගොඩට ආවා..ඔයාලාට ගොඩක් ස්තූතියි.

මට ගොඩට එන්න උදවු කළාට.

එදා ඉඳලා හැමෝම හොඳ යාළුවෝ වුණා.

අවසානයි.......

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැඟීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.එම බීජ දලුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප ,පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘති මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය,දියණියන්,ගුරුභවතුන් ,දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපගේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ,සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනවිරත්න මහලේකම්

ISBN 978-624-208-390-2